සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 2

විෂය - බුද්ධ ධර්මය

ශ්‍රේණිය - 5

2021 ජුනි මාසය

සැකසුම : ඉරේෂා නිල්මිණි මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 5.පාඩම - සිනා සී කතා කරමු.

ආදරණීය දුවේ පුතේ අපි අද තවත් පාඩමක් කතා කරමුකෝ.මොකක්ද දන්නවද පුතේ ,ඒ පාඩම තමයි සිනා සී කතා කරමු කියන පාඩම.

- ඉතින් දුවේ පුතේ මට කියන්නකෝ පුබ්බභාසී කියන්නේ මොකක්ද කියලා.
- පුතේ අපි පුබ්බභාසී කියල වචනයකුත් ඉගෙන ගත්තානේ,ඉතින් මට කියන්නකෝ පුබ්බභාසී කියන්නේ මොකක්ද කියලා.
- දුවේ පුතේ ඔයාල මගතොටේ යද්දි ඔයාල දන්න හඳුනන යාලුවො, අසල්වාසින් එහෙම හමු වෙනවා නේද? එයාලට සුහදව කතා කරන්නේ කොහොමද කියලත් කියන්නකෝ.
- ඔයාල දුවේ පුතේ බස් රථයක වාඩිවෙලා යද්දි ඔයාලගෙ ගුරුවරයෙක් හරි ගැබිනි මවක් හරි ආබාධිත කෙනෙක් හරි බසයට නැග්ග විට ඔයාල කරන්නේ මොකක්ද කියන්නකෝ.
- පුතේ ඔයාල පාරෙ ගමන් කරන කොට යන්න ඕන විදිහක් තියෙනවානේ.ඒ කොහොමද කියන්නකෝ.

ඔයාල දැන් ගොඩක් දේවල් ඉගෙන ගත්තානේ නේද,ඒ නිසා මේ පුංචි ක්‍රියාකාරකමත් කරලා බලන්නකෝ.

- දන්නා හඳුනන අයකු දුටු විට පළමුව කතා කිරීම නරක පුරුද්දකි. (    )
- පුබ්බභාසී යනු පළමු ව කතා කිරීමයි. (    )
- පිරිසිදු බව හා චාම්බව අපේ ලස්සන වැඩි කරයි. (    )
- සැහැල්ලු දිවි පැවැත්ම අපේ ජීවිත සාර්ථක කරයි. (    )

ඉතින් මගෙ දුවේ පුතේ සිනා සී කතා කිරීමෙන් ඔයාලට ගොඩක් දේවල් ලැබෙනවා නේද? එහෙමනම් ඔයාලා සුහදශීලීව ඔයාලගේ ලස්සන තවත් වැඩි කරන අමිල සිනහව නිරතුරුව ඔයාලගේ මුවග රඳවා ගමු මගෙ දරුවනේ.

බුද්ධ ධර්මය විෂයට අදාළ වීඩියෝ enanapiyasa වෙබ් අඩියේ සුහුරු පාඩම් යටතේ ලබා ගත හැකිය